ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

13 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය

ජෛව පද්ධති තාක්ෂණවේදය I කාලය පැය 2

(01) පහත දක්වා ඇත්තේA,B,Cනම් දේශගුණික සාධක තුනක් බෝග අස්වනු කෙරෙහි සිදු කරන බලපෑම වේ.

A- කොළ එළවළු වල වර්ණය කෙරෙහි බලපායි.

B- බෝග පහසුවෙන් දිලීර රෝගවලට භාජනයවීම කෙරෙහි බලපායි.

C- අඹවල ද්‍රව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණය කෙරෙහි බලපායි.

A,B,Cඅනුපිළිවෙළින් දැක්වෙනුයේ,

(1) උෂ්ණත්වය,සාපේක්ෂ ආර්ද්‍රතාවය හා ආලෝකය වේ.

(2) ආලෝකය,සාපේක්ෂ ආර්ද්‍රතාවය හා උෂ්ණත්වය වේ.

(3) සාපේක්ෂ ආර්ද්‍රතාවය,උෂ්ණත්වය හා ආලෝකය වේ.

(4) වර්ෂාපතනය,උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාවය වේ.

(5) වර්ෂාපතනය, සුළඟ හා ආලෝකය වේ.

(02) වර්ෂාපතනය 70mm වූ දිනෙක වාෂ්පීකරණ තැටියෙහි පෙර දින පාඨාංකය 18cm විය. එදින වාෂ්පීකරණය 20mm නම් එදින වාෂ්පීකරණ තැටියෙහි පාඨාංකය වනුයේ,

(1) 25cm (2) 16 cm (3) 20cm (4) 23cm (5) 27cm

(03) පසෙහි පවතින ඇමීන හා ඇමෝනියම් අයන ශාකවලට වඩාත් අවශෝෂනය පහසු වන නයිට්‍රේට් බවට පත් කිරීමට දායක වන්නේ,

(1) *Nitrobactor* හා *Nitrosomonas ය.*

(2) *Thiobacillus* හා *Rhizobium ය.*

(3)*Azatobactor* හා *Rhizobium* ය.

(4) *Thiobacilus* හා *Pseudomonas* ය.

(5) Nitrobactor හා Rhizobium ය.

(04) අලිගැටපේර. අඹ හා රඹුටන් ශාකවලට සුදුසුම ශාකා ප්‍රචාරණ ක්‍රම පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) ගොඩැලි අතු බැඳීම, රිකිලි බද්ධය හා අංකුර බද්ධය.

(2) ජීව්හා බද්ධය, රිකිලි බද්ධය හා අංකුර බද්ධය.

(3) හරිත බද්ධය,අංකුර බද්ධය හා රිකිලි බද්ධය.

(4) හරිත බද්ධය, අංකුර බද්ධය හා පැළුම් රිකිලි බද්ධය.

(5) හරිත බද්ධය, රිකිලි බද්ධය හා අංකුර බද්ධය.

(05) කේන්ද්‍රසාරී පොම්පයක් භාවිතයෙන් උඩිස් ටැංකියකට ජලය පුරවා පොම්පය ක්‍රියා විරහිත කළ විට නැවත උඩිස් ටැංකියේ ඇති ජලය ජල ප්‍රභවයට ඉවත් වන බව දැනගන්නා ලදි. මෙසේ වීමට වඩාත්ම හේතු විය හැක්කේ ,

(1) පා කපාටය ක්‍රියා විරහිත වීමය.

(2) පොම්පයේ ධාරිතාව අඩු වීමය.

(3) පොම්පයේ චූෂණ හිස 10mට වඩා ඉහළවීමය.

(4) පොම්පයේ විසර්ජන හිස 6m ට වඩා විශාල වීමය.

(5 චූෂණ නලයේ විශ්කම්භය අඩුවීමය.

(06)

රූපයේ දැක්වෙන බිම් සැකසීමේ උපකරණය.

(1) මිනිස් ශ්‍රමයෙන් ක්‍රියා කරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.

(2) මිනිස් ශ්‍රමයෙන් ක්‍රියා කරන ද්විතියීක බිම් සැකසීමේ උපකරණයකි.

(3) යාන්ත්‍රික බලයෙන් ක්‍රියා කරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.

(4) යාන්ත්‍රික බලයෙන් ක්‍රියා කරන ද්වියීක බිම් සැකසීමේ උපකරණයකි.

(5) සත්ත්ව ශ්‍රමයෙන් ක්‍රියා කරන ද්විතියීක බිම් සැකසීමේ උපකරණයකි.

(07) තවානක් සූර්යතාපය මගින් ජීවානුහරණය සිදු කිරීමේ දී,
(1) තවානට ලී කුඩු යෙදීම වඩාත් උචිත වේ.
(2) සුළගේ දිශාවට ප්‍රතිවිරුද්ධව ගිනි තැබීම කළ යුතුය.
(3) මුලින් ම දිලීර නාශක යෙදීම සිදු කළ යුතුය.
(4) තවාන මුලින් වතුර ඉසිමින් තෙත් කළ යුතුය.
(5) අඩු ඝනත්ව පොලිතින් යෙදීම වඩාත් උචිත වේ.

(08) 5ha වගා ක්ෂේත්‍රයක වල් මර්දනය සඳහා වල් නාශක ලීටර 8ක් අවශ්‍ය වේ. දියර ඉසින්නා විසින් එක් හෙක්ටයාරයකට ඉසිනු ලබන දියර ප්‍රමාණය 100Lකි. ජලය 10L කට මිශ්‍ර කළ යුතු වල් නාශක ප්‍රමාණය වන්නේ,
(1) 0.4L කි. (2) 0.8L කි. (3) 1.6Lකි. (4)0.16Lකි. (5) 8Lකි.

(09) වී තැම්බීම පිළිබඳ ව පහත වගන්ති අතුරින් අසත්‍ය වගන්තිය වන්නේ,
(1) වී තැම්බීම මගින් එන්සයිම විනාශ විය හැක.
(2) වී තැම්බීම නිසා සහල් මුඩුවීමේ හැකියාව අඩුවේ.
(3) වී තැම්බීමේ දී පිෂ්ඨය ජෙලටිනීකරණය වේ.
(4) වී තැම්බීමට පෙර පෙගවිය යුත්තේ මද උණුසුම් ජලයෙනි.
(5) වී තැම්බීම නිසා පෝෂක සංඝටක ආරක්ෂා වේ.

(10) අස්වනු නෙලීමට සුදුසු අවස්ථාවේ දී එහි පරිණත මට්ටම පසු අස්වනු තාක්ෂණය කෙරෙහි බලපායි. නිසි අස්වනු නෙළන අවස්ථාවේ දී අර්ධව වර්ධනය වූ ඵල හා සම්පූර්ණයෙන් වර්ධනය වූ ඵලවලට උදාහරණ වනුයේ,
(1) පිපිඤ්ඤා හා තක්කාලි වේ. (2) ඇපල් හා තක්කාලි වේ.
(3) පිපිඤ්ඤා හා බණ්ඩක්කා වේ. (4) ඇපල් හා බණ්ඩක්කා වේ.
(5) බණ්ඩක්කා හා පිපිඤ්ඤා වේ.

(11) බෲඩර සම්බන්ධ පහත දක්වා ඇති ප්‍රකාශ වලින් අසත්‍ය ප්‍රකාශය වන්නේ,
(1) කුකුළු පාලනයේ දී පැටව් රැක්කවීමට යොදා ගන්නා ව්‍යුහ වර්ගයයි.
(2) බෲඩර නිර්මාණය කිරීම සඳහා කාඩ්බෝඩ් භාවිතා කරයි.
(3) 1m^2 වර්ගඵලයක් ඇති බෲඩරයක පැටව් 100ක් පමණ ඇති කළ හැකි වේ.
(4) වෘත්තාකාර හැඩයට සැකසීමෙන් පැටවුන් ගමන් කිරීමට ඇති හැකියාව වැඩි වී වර්ධනය වේ.
(5) බෲඩරයක උෂ්ණත්වය පාලනය කිරීමට කහ පැහැති බල්බ උස වෙනස් කරමින් භාවිත කළ හැකිය.

(12) කිකිළි බිත්තරයක බිංජෞෂණ කාලය වන්නේ ,
(1) දින 36කි (2) දින 21කි (3) දින 24කි (4) දින 28කි (5) දින 30කි

(13) කිරි සාම්පලයක මුළු ආම්ලිකතාවය සෙවීමේ අනුමාපනයක දී 10ml කිරි සාම්පලයක් 0.1 $moldm^{-3}$ NaClමගින් අනුමාපනය කළ විට උදාසින කිරීමට වැය වූ NaCl ප්‍රමාණය 1.5ml නම් කිරි සාම්පලයේ අම්ල ප්‍රතිශතය වන්නේ, (ලැක්ටික් අම්ලයේ මවුලිකස්කන්ධය 90කි.)

(1) 1.350% (2) 0.150% (3) 0.135% (4)1.50% (5) 1.00%

(14) පළතුරු වියළීම මගින් කල් තබා ගැනීමට සූදානම් කිරීමේ දී මුලින්ම ස්ට්‍රික් අම්ල ද්‍රාවණයක ගිල්වන්නේ,

(1) සෛල ශක්තිමත් කිරීමටය

(2) case hardening වැළකීමටය

(3) ජල ප්‍රතිශතය අඩු කිරීමටය.

(4) දුඹුරුවීම නැවැත්වීමටය.

(5) බැක්ටීරියා ක්රියාව දියුණු කිරීමටය.

(15) ශ්‍රී ලංකාව වැනි නිවර්තන කලාපීය රටවල බෝග ආරක්ෂිත ව්‍යූහ භාවිතයට ඇතිවන ප්‍රධානතම අභියෝගය වන්නේ,

(1) හරිතාගාර ආවරණය මත දූවිලි තැන්පත්වීම හා ඇල්ගී බැදීම

(2) ආරක්ෂිත ව්‍යුහ තුළ සිදුවන වායු හුවමාරුව දුර්වල වීම

(3) අභ්‍යන්තර පරිසරයේ CO_2 සාන්ද්‍රණය අඩුවීම

(4) අධික ආර්ද්‍රතාවය නිසා බෝගවලට දිලීර රෝග පැතිරීම

(5) දිවා කාලයේ දී අභ්‍යන්තර උෂ්ණත්වය ඉහළ යාම.

(16) ආරක්ෂිත ගෘහ තුළ බෝග සඳහා විශේෂ නඩත්තු කටයුතු වලදී දෙදරුම් ජනකයක් භාවිත කරන්නේ,

(1) ගෘහය තුළ උෂ්ණත්වය පාලනය සඳහා

(2) ගෘහය තුළ මනා වාතය සඳහා

(3) ගෘහය තුළ ආර්ද්‍රතාවය පාලනය සඳහා

(4) බෝගවල පරාගන ක්‍රියාව සඳහා

(5) බෝගවල පලිබෝධ පාලනය සඳහා

(17) පැපොල් රැස්කිරීම සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න,

A- කැපුම් ගැඹුර වැඩි වුවහොත් කිරිවලට පිෂ්ඨය එකතුවීමෙන් ගුණාත්මකය බාලවිය හැකිය

B- කිරි ලබා ගැනීමේ නියමිත පරිණත දර්ශකය වනුයේ ගෙඩියේ ඉදිමුණු ස්ථාන ලා කහ පැහැති වූ අවස්ථාවයි.

C-එකතු කරගත් පැපොල් කිරි තද හිරු රශ්මියේ වියළා ගබඩා කළ යුතුය.

ඉහත ප්‍රකාශ අතුරින්,

(1) A පමණක් සත්‍ය වේ.
(2) B පමණක් සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ.
(4) A හා C සත්‍ය වේ.
(5) A,B,C සියල්ල සත්‍ය වේ.

(18) නවීනකෘත අභ්‍යන්තර වායු පරිසර තත්ත්ව යටතේ ඇසුරුම් කිරීමේ දී මස් හා මාළු ඇසුරම් කරනුයේ පහත සඳහන් කුමන තත්ත්ව යටතේ ද?

(1) N_2වැනි අක්‍රිය වායු පිරවීමෙනි
(2) O_2 ප්‍රතිශතය අඩු කිරීමෙනි
(3) N_2 ප්‍රතිශතය අඩු කිරීමෙනි
(4) CO_2 ඉවත් කිරීමෙනි
(5) O_2 ඉවත් කිරීමෙනි

(19) සරල සීනි හා ඇමයිනෝ අම්ල සහිත ආහාර රත් කිරීමේදී දුඹුරු පැහැයට ලක් වීම හඳුන්වනු ලබන්නේ

(1) කැරමලීකරණය ලෙසය
(2) මෙලාඩ් ප්‍රතික්‍රියාව ලෙසය
(3) එන්සයිමය දුඹුරු වීම ලෙසය
(4) ජල විච්ඡේදන මුඩු වීම ලෙසය
(5) පැසීම ලෙසය

(20) ඉන්ද්‍රීය ගෝචරතාව ඇගයීමට ලක් කරන පරීක්ෂණ අතර ආහාර ද්‍රව්‍ය සඳහා පාරිභෝගිකයාගේ කැමැත්ත/අකමැත්ත තීරණය කරන පරීක්ෂණ හදුන්වනු ලබන්නේ,

(1) Difference test ලෙසය.
(2) Ranking for Intensity test ලෙසය.
(3) Hedonic test ලෙසය.
(4) Sooring for intensity test ලෙසය.
(5) Descriptive analysis test ලෙසය.

(21) නැවුම් තත්ත්වයේ පවතින එළවළු හා පළතුරුවල ජල සක්‍රියතා අගය හා සමතුලිත සාපේක්ෂ ආර්ද්‍රතාවය පිළිවෙළින් දැක්වෙනුයේ,

(1)1 හා 100 වේ. (2) 0.9 හා 99 වේ. (3) 0.75 හා 75 වේ.

(4) 99 හා 9 වේ. (5). 75 හා 0.75 වේ.

(22). පහත දී ඇති දත්ත භාවිත කර බිත්තරයක සුදු මදයේ සහ බිත්තර කටුවේ ප්‍රතිශතය පිළිවෙළින් ගණනය කර ඇත්තේ,

- සම්පූර්ණ බිත්තරයේ බර 56g
- සුදු මදයේ බර 26.88g
- කහමදයේ බර 23.80g

(1) 30% සහ 9.5 % වේ. (2) 30% සහ 11% වේ.

(3) 48% සහ 30% වේ. (4) 48% සහ 11% වේ.

(5) 56% සහ 11% වේ.

(23). මත්ස්‍ය පොකුණක සිටින මත්ස්‍යයින් බොහෝමයක් ජල පෘෂ්ඨය මතුපිට ආසන්නයේ ගැවසෙනු දක්නට ලැබිණ. එයට වඩාත්ම හේතු විය හැක්කේ,

(1) ජලයේ අවිලතාවය ඉහළ වීමය (2) ජලයේ ආම්ලිකතාවය වැඩි වීමය

(3) ජලයේ Do අඩු වීමය (4) ජලයේ coliform වැඩි වීමය

(5) මත්ස්‍යයින්ට බැක්ටීරියා ආසාධනයක් ඇති වීමය.

(24) අතු බැඳීමේ ක්‍රියාවලියේ දී,

(1) මුල් ඇද්දවීමට අපේක්ෂිත ස්ථානයට ඉහළින් පිහිටි කොටස පොතු ඉවත් කළ යුතුය.

(2) පොත්ත ඉවත් නොකළ යුතු අතර අත්තෙහි පත්‍ර වලින් අර්ධයක් ඉවත් කළ යුතුය.

(3) මුල් ඇද්දවීමට අපේක්ෂිත ස්ථානයට පහළින් පිහිටි කොටසේ පොත්ත ඉවත් කළ යුතුය.

(4) අත්තෙහි පොත්ත සහ පත්‍ර වලින් අර්ධයක් ඉවත් කළ යුතුය.

(5) අත්තෙහි පිහිටි සියලුම පත්‍ර ඉවත් කළ යුතුය.

(25) පසු අස්වනු හානි අවම වන පරිදි ධාන්‍ය ගබඩා කිරීමේ දී සුළභව භාවිත කරනු ලබන ක්‍රමවේදයක් වන්නේ,

(1) පරිසර උෂ්ණත්වයට වඩා ඉහළ උෂ්ණත්වයක ධාන්‍ය ගබඩා කිරීමය.

(2) ගබඩා කිරීමට පෙර ධාන්‍ය වර්ග පිරිසිදු කිරීමය.

(3) ගබඩා කිරීමට පෙර ආරක්ෂාකාරි තෙතමන ප්‍රතිශතයක් ලඟා වන තෙක් ධාන්‍ය වියළීමය.

(4) නිරතුරුවම කෘමිනාශක යෙදීමෙනි.

(5) තෙත් බරින් 1% කට වඩා අඩු තෙතමනයකට ළගා වනසේ ධාන්‍ය වියලීමය.

(26) ලේබල් කරණයේ අරමුණු පිළිබදව පහත වගන්තිවල දක්වා ඇත.

A-ආහාර නිෂ්පාදනයක ලේබලයේ එහි ගුණාත්මක භාවය පිළිබදව සියලු තොරතුරු අඩංගු විය යුතුය.

B-නිෂ්පාදනයට අමුද්‍රව්‍ය පිළිබද සංක්ෂිප්තවත් තොරතුරු ලේබලයෙහි දැක්විය යුතුය.

C-ආහාර නිෂ්පාදනයක ලේබලය සියලු නෛතික අවශ්‍යතා සපුරාලිය යුතුය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,

(1) A පමණි (2) B පමණි (3) C පමණි

(4) A හා B පමණි (5) B හා C පමණි

(27) බිස්කට් සාම්පලයක ඉන්ද්‍රීය ගෝචරණය ඇගයීම පිළිබද ප්‍රකාශ පහත දක්වා ඇත.

A- ඉන්ද්‍රිය ගෝචරතා අගයන්නා විසින් බිස්කට් සාම්පලයේ වට්ටෝරුව දත යුතුය.

B- ඉන්ද්‍රිය ගෝචරතා ඇගයීම අපක්ෂපාතී පරිසරයක සිදු කළ යුතුය.

C- නිසි ලෙස සැලසුම් කළ ඇගයීම් පත්‍රිකා ඇගයීම් සදහා භාවිත කළ යුතුය.

මේ අතුරින් නිවැරදි වන්නේ,

(1) A පමණි (2) B පමණි (3) C පමණි

(4) A හා B පමණි (5) B හා C පමණි

(28) වැරදි පසු අස්වනු ක්‍රියා නිසා බණ්ඩක්කා සදහා වෙළෙදපොළ ඉල්ලුම සැළකිය යුතු ප්‍රමාණයකට නැති වී යයි. මෙම තත්ත්වය අවම කර ලත හැක්කේ,

(1) පිරිසිදු හා සේදීමේ තාක්ෂණ අනුගමනය කිරීම මගින්

(2) වර්ධන දර්ශක හා නෙලීමේ තාක්ෂණ අනුගමනය කිරීම මගින්

(3) පිරිසිදු කිරීමේ හා ප්‍රවාහන ක්‍රම අනුගමනය කිරීම මගින්

(4) වර්ධන දර්ශක හා පිරිසිදු කිරීමේ ක්‍රම අනුගමනය කිරීම මගින්

(5) නෙලීමේ හා ප්‍රවාහනය කිරීමේ ක්‍රම අනුගමනය කිරීම මගින්

(29) රබර් කිරි කැපීම හා සම්බන්ධව ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත.

A-රබර් කිරි කපා ගැනීමට ප්ලෝයම දක්වා ැපුම යෙදිය යුතුය.

B- ආනතිය 15^0 ක් වන පරිදි කැපුම යෙදීමෙන් උපරිම කිරි අස්වැන්නක් ලබා ගත හැකිය.

C-කදේ වට ප්‍රමාණයෙන් 1/5 ක් කැපුම නොයොදා ඉතිරි කළ යුතුය.

D-කදේ කැම්බියට පටකයට හානි නොවන ලෙස කැපුම යෙදිය යුතුය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1)AහාB පමණි (2) C හා Dපමණි (3) A,B හා C පමණි

(4) A,Cහා D පමණි (5) A,B,C හා D පමණි

(30) 1980 අංක 26 දරණ ආහාර පණත පිළිබදව පිළිගත නොහැකි ප්‍රකාශය තෝරන්න.

(1) එම පනත ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වන්නේ සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම්වරයාය.

(2) ආහාර පනත ප්‍රධාන කොටස් හතරකින් යුක්ත වේ.

(3) ග්‍රාමීය වශයෙන් මෙය ක්‍රියාත්මක කිරීමේ බලය මහජන සෞඛ්‍ය පරීක්ෂක සතු වේ

(4) මෙහි දෙවන කොටසේ ආහාර පනතේ පරිපාලනය පැහැදලි කරයි.

(5) පනත යටතේ වැරදි කරුවකු වන අයකු හට ක්‍රියාත්මක වන නෛතික පිලිවෙත් පිළිබඳ මෙහි තෙවන කොටසේ අන්තර්ගත වේ.

(31) ශ්‍රී ලංකාවේ කලපු ආශ්‍රිතව සුළභව වගා කර ඇති මත්ස්‍ය විශේෂය වනුයේ,

(1) චෙක්කයා (2) තිලාපියා (3) මිරිගාල් (4) කැටිලා (5) රෝනු

(32) තලමේස බිම් මැනීම වඩාත් සුදුසු වන්නේ

(1) ගොඩනැගිලි ගස් සහිත විශාල භූමි වලටය.

(2) අධික බෑවුම් සහිත බිම් වලටය.

(3) මායිම් සීමා බැලීමේ දී බාධක අඩු කුඩා භූමි වලටය.

(4) දම්වැල් මැනීම කළ නොහැකි භූමි වලටය.

(5)අපැහැදිලි මායිම් සීමා සහිත භූමි වලටය.

(33) බිංදු ජල සම්පාදනයේ එක් අවාසියක් වන්නේ,

(1) ජලසම්පාදන සීඝ්‍රතාව අනෙකුත් පුෂ්පීය ජලසම්පාදන ක්‍රම වඩා වැඩි වීමයත

(2) සිරවීම සහ දියර පොහොර බිංදු ජල සම්පාදන සහිත යෙදීම නොහැකි වීමය

(3) අනෙකුත් ජල සම්පාදන ක්‍රමවලට සාපේක්ෂව වියදම් අධික වීමය

(4) භූ විෂමතාවයක් ඇති භූමිවලට ජලසම්පාදන සඳහා වියදම් වීමය

(5) ජලයේ රොඩු තිබුණහොත් බිම් කොටසේ සිර වී ජලය සම්පාදනය වීමට බාධා ඇති වීමය.

(34) පහත ප්‍රකාශ සලකා බලන්න ,

A- ඒන්ජල් මත්ස්‍යයින්ගේ අභිජනන ටැංකි වලට මාබල් දැමිය යුතුය

B- ඒන්ජල් යනු බිත්තර විසුරුවන වර්ගයේ මත්ස්‍යයින්ය.

ඉහත ප්‍රකාශ අතරින්

(1) A පමණක් සත්‍ය වේ

(2) B පමණක් සත්‍ය වේ.

(3) A හා B සත්‍ය වේ.

(4)A හා B සත්‍ය වන අතර B මගින් පැහැදිලි කරයි.

(5) A හා B සත්‍ය වන අතර A මගින් පැහැදිලි කරයි.

(35) ඩීසල් එන්ජින් සදහා වඩාත් සුදුසු ලිහිසි තෙල් විය යුතු අගය විය යුතු SAE අගය විය යුත්තේ

(1) SAE40 (2) SAE90 (3) SAE20 (4) SAE50 (5) SAE120

(36) හිටි ගසක විශ්කම්භය මැනීමේ දී එය පසු මට්ටමේ උසෙන් ලබා ගනී. ජාත්‍යන්තරව පිළිගත් පසු මට්ටමේ උස වන්නේ,

(1) 1.3m (2) 1.6m (3) 1.5 m (4) 1.2m (5) 0.9m

(37) පහත ඒවා අතරින් සක්‍රිය කාබන් පිළිබද අසත්‍ය වනුයේ,

(1) කාර්මීකරණයේ දී නිපදවෙන අපද්‍රව්‍ය නිස්සාරණය කිරීමට යොදා ගනී.

(2) ඉහළ ඔක්සිජන් ප්‍රවාහයක් යටතේ දහනය කිරීමෙන් නිපදවා ගනී.

(3) ජලයේ පවතින ක්ලෝරීන් ඉවත් කිරීමේ හැකියාව ඇත.

(4) රත්‍රං ආකර වලින් රත්‍රං නිස්සාරණය සදහා යොදා ගනී.

(5) වායු පෙරීම හා සම්බන්ධ කාර්යයන් සඳහා යොදා ගනී.

(38) සුදු ගම්මිරිස් නිෂ්පාදන ක්‍රියාවලියේ දී ගම්මිරිස් 2% සිට්රික් අම්ල ද්‍රාවණයක ගිල්වා තබනුයේ,
(1) පොත්ත ඉවත් කිරීම පහසු වීම සදහාය
(2) ගම්මිරිස් වලට තීව්‍ර සුදු පැහැයක් ලබාදීම සදහාය.
(3) ගම්මිරිස් වියළීම පහසු කර ගැනීම සදහාය.
(4) ශ්‍රේණිගත කිරීම පහසු කර ගැනීම සදහාය.
(5) බොල් ඇට පා වීමට සැලැස් විම සඳහාය.

(39) භාණ්ඩයක ලේබලයේ ඇති ඉරි කේතාංකය යොදා ගන්නේ
(1) භාණ්ඩ තත්ත්වය ප්‍රකාශ කිරීමටය
(2) අලෙවිය පහසු කිරීමටය
(3) භාණ්ඩ ආනයනය හා අපනයනය පහසු කර වීමටය
(4) විකිණි ඇති භාණ්ඩ ප්‍රමාණය හා ගබඩාවේ ඇති භාණ්ඩ ප්‍රමාණය දැන ගැනීමටය.
(5) භාණ්ඩයේ කල් ඉකුත් වීම පිළිබඳ අදහසක් ලබා ගැනීමටය.

(40) සාපේක්ෂ ආර්ද්‍රතාවය ජෛව පද්ධති කෙරෙහි බලපෑම් ඇති කරන අවස්ථාවකට උදාහරණ වන්නේ,

(1) ශාක ප්‍රභාවර්තී චලන ඇති වීමය

(2) සතුන්ගේ ආහාර ආගනුව අඩු කිරීමය

(3) මත්ස්‍යයින්ගේ ගහණ ඝනත්වය වර්ධනයට

(4) සාගර දියවැල් වර්ධනයට

(5) ජල සම්පාදන කාලාන්තර තීරණයට

(41) සරල පරිපථ සටහනක් පහත දැක්වේ.



පරිපථය තුළින් ගලන ධාරාව වන්නේ,

(1) 71A (2) 0.71A (3) 710A (4) 0.071A (5) 7.1A

(42) වර්ණ තීරු 04ක් ඇති ප්‍රතිරෝධකයක් පහත රූපසටහනේ දැක්වේ. මෙම ප්‍රතිරෝධකයේ අගය වන්නේ



(1) 4700 + - 5% (2) 47000+ - 10% (3) 470+ - 5%

(4) 470+ - 10% (5) 47000+ - 5%

(43) කාර්මික අවශ්‍යතා සඳහා වඩාත් යෝග්‍ය පොම්ප වර්ගය වන්නේ,

(1) වැසුනු ඉම්පේලරය සහිත ස්වපූර්ණය වන කේන්ද්‍රාපසාරී පොම්ප වේ.

(2) වැසුනු ඉම්පේලරය සහිත ස්වපූර්ණය නොවන කේන්ද්‍රාපසාරී පොම්ප වේ.

(3) අර්ධව වැසුනු ඉම්පේලරය සහිත ස්වපූර්ණය නොවන කේන්ද්‍රාපසාරී පොම්ප වේ.

(4) විවෘත ඉම්පේලරය සහිත ස්වපූර්ණය වන කේන්ද්‍රාපසාරී පොම්ප වේ.

(5) විවෘත ඉම්පේලරය සහිත ස්වපූර්ණය නොවන කේන්ද්‍රාපසාරී පොම්ප වේ.

(44) පහත ප්‍රකාශ සලකා බලන්න

A - කඩදාසි සෑදීම සඳහා ඇකේෂියා වැනි ශාක භාවිතා කරයි.

B - මේවායේ ඉහළ සෙලියුලෝස් ප්‍රමාණයක් ඇත.

(1) A පමණක් සත්‍ය වේ.

(2) A පමණක් සත්‍ය වේ.

(3) A හා B සත්‍ය වේ.

(4) A හා B සත්‍ය වන අතර A මගින් B පැහැදිලි කරයි.

(5) A හා B සත්‍ය වන අතර B මගින් A පැහැදිලි කරයි.

(45) ශ්‍රී ලංකාවේ ආහාර බෝග ආශ්‍රිත පසු අස්වනු හානිය දළ වශයෙන්

(1) 8 - 10%

(2) 5 - 10%

(3) 30 - 35%

(4) 15 - 20%

(5) 20 - 25%

(46) වැඩිම ජලාකාර්ශන ජලය ප්‍රමාණයක් දක්නට ලැබෙනුයේ

(1) ලිහිල් මැටි පසකය.

(2) වැලිමය ලෝම පසකය.

(3) ලිහිල් වැලි පසකය.

(4) සුසංහිත මැටි පසකය.

(5) සුසංහිත වැලි පසකය.

(47) ලැත් නිවාස පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - අර්ධ ස්ථිර ප්‍රචාරක ව්‍යුහ ගණයට අයත් වේ.

B - පරිසර උෂ්ණත්වය වැඩි කිරීම සඳහා යොදා ගනු ලබන ව්‍යුහ වේ.

C - නුවරඑළිය වැනි උඩරට ප්‍රදේශ වලට වඩාත් උචිත වේ.

D - මූලික අරමුණ සෙවණ සැපයීම සහ සුළඟින් බෝග ආරක්ෂා කර ගැනීමය.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වනුයේ

(1) A හා B පමණි.

(2) A හා C පමණි.

(3) A හා D පමණි.

(4) A , B හා C පමණි.

(5) B , C හා D පමණි.

(48) HACCP පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී HACCP කණ්ඩායම නම් විශේෂිත කණ්ඩායමක් සකස් කළ යුතුයි. එහිදි සැලකිය යුතු කරුණක් වන්නේ,

(1) එම කණ්ඩායමට බාහිර පුද්ගලයන් සම්බන්ධ කර ගත යුතුය.

(2) සත්ත්ව පාලන අංශයේ නිලධාරීන් පමණක් ඊට ඇතුළත් විය යුතුය.

(3) ප්‍රමිති සහතිකය පිරිනමන ආයතනයේ නිළධාරියෙක්ද ඊට ඇතුළත් විය යුතුය.

(4) ආයතයේ පරිපාලන ව්‍යුහයේ ඉහළ මට්ටමේ නිළධාරීන් පමණක් ඊට ඇතුළත් විය යුතුය.

(5) ආහාර සැකසීම හා සම්බන්ධ විවිධ නිළධාරීන් ඊට ඇතුලත් විය යුතුය.

(49) කිරි පැස්චරීකරණය කිරීමේ ප්‍රධාන අවාසියක් වන්නේ

(1) කිරි කල්තබා ගැනීමේ හැකියාව වැඩිවේ.

(2) චීස්, යෝගට් වැනි කිරි නිශ්පාදන නිපදවිය හැකි වේ.

(3) ජෛවයේ ලක්ෂණ හානි වීම අඩුවේ.

(4) Ca^{2+} හා PO_4^{3-} සුළු ප්‍රමාණයක් අවක්ෂේප වේ.

(5) කිරි වල වර්ණය ආරක්ෂා වේ.

(50) දිග 2.5cm වූ මත්සයින් 5දෙනෙකු දැමීම සඳහා සාදා ගත යුතු ටැංකියේ ක්ෂේත්‍ර ඵලය විය යුත්තේ

(1) 64 cm^2

(2) 90 cm^2

(3) 180 cm^2

(4) 320 cm^2

(5) 640 cm^2